ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022-09-08 |

පැමිණිලි පාර්ශවය : ඩබ්. වමින්ද මයා,
අංක 91(29/127), ධර්මරාජ මාවත,
මහනුවර.

වගඋත්තර පාර්ශවය : 01 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. විදුහල්පති,
මහ/ධර්මරාජ විද්‍යාලය,
මහනුවර.

**පැමිණිලි අංකය : HRC/K/717/16**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම පළමු දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ඒ වන විට 4 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත්, ඒ අනුව තමාගේ දෙවන දරුවා වන කළණ සුධම් වීරතුංග දරුවා සහෝදර පදනම යටතේ 2017 වර්ෂයේ පළමු වසරට ඇතුළත් කිරීම සඳහා නිසි පරිදි අයදුම්පත් යොමු කරන ලද බවත්ය.

එකී අයදුම්පත අනුව තමා බීආර් - 55 යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත්ව ලකුණු 54 ක් ලබා තාවකාලික නාම ලේඛනයට ඇතුළත්ව තිබූ අතර, තමා විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයකට අනුව සම්මුඛ පරීක්ෂණයෙන් ලබාදුන් ලකුණු 4 අභියාචනා පරීක්ෂණයේදී ලකුණු 08 ක් දක්වා වැඩිකර පදිංචිය තහවුරු කිරීම සඳහා ලේඛන යටතේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දුන් ලකුණු 4 කපා හැර



| | | |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04. | |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11-2505580 / 81 / 82 | |
| සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | |
| ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | |
| ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541/ 74 | |
| ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 | |
| ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrcsl@gmail.com | |
| වෙබ් / இணையம் / Web | www.hrcsl.lk | |

ලකුණු 1 ක් දක්වා අඩු කරන ලද බවත්, ඒ හේතුවෙන් තම දරුවාට වගඋත්තරකාර විද්‍යාලයට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි කරන ලද බවත්, එසේම තමන්ට වඩා අඩු සුදුසුකම් ලබාගත් අයදුම්කරුවන් සම්බන්ධයෙන් තමා විසින් විරෝධතාවයක් ඉදිරිපත් කළද, එම විරෝධතා සම්බන්ධයෙන් විරෝධතා පරීක්ෂණයක් සිදු නොකිරීම තුළින් තම දරුවාට අසාධාරණයක් සිදුවූ බවත් දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම් :-**

2017 පළමු වසර සඳහා මෙම පැමිණිලිකරු විසින් ඔහුගේ දරුවා වන කළණ සුධම් වීරතුංග දරුවා පාසලට ඇතුළත් කිරීම සඳහා සහෝදර පදනම යටතේ බීආර් 55 යටතේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්ව ලකුණු 54 ක් උපයාගන්නා ලද බවත්, පසුව ඔහු විසින් කරන ලද අභියාචනය අනුව අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් ඔහු වෙත ලකුණු 55 ක් ලබා දී ඇති බවත්, අභියාචනා මණ්ඩලයෙන් බඳු ගිවිසුම සඳහා ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් ලබා දුන් ලකුණු 4 ඉවත් කොට සානුකම්පිතව සලකා බලා එයට ලකුණු 1 ක් පමණක් ලබාදී ඇති අතර, පාසල වෙනුවෙන් ජයග්‍රහණ/දායකත්ව සඳහා ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් දෙමාපිය/භාරකරුවන් පාසලට දක්වන ලද විවිධාකාර සහයන් සඳහා ලකුණු 4 ක් ලබාදුන්නද අභියාචනා මණ්ඩලය විසින් එය ලකුණු 8 ක් දක්වා වැඩිකර මුළු ලකුණු 55 ක් ලබා දී පොරොත්තු ලේඛනයේ සිවුවන ස්ථානයේ රඳවා ඇති බවත් දක්වා ඇත. විද්‍යාලයේ පළමු වසරට ළමුන් ඇතුළත් කරගැනීමේ අවම ලකුණු සීමාව ලකුණු 59 ක් වූ බැවින් මෙම ළමයා එම ලකුණු උපයානොගත් බැවින් දරුවා පාසලට ඇතුළත් කර ගැනීමට නොහැකි වූ බවත්, ඉදිරියේදි පවතින පුරප්පාඩු මත මෙම දරුවා පාසලට ඇතුළත් කරගැනීමේ හැකියාවක් ඇති බවත් වැඩිදුරටත් දන්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරුගේ වැඩිමහල් දරුවා ඒ වන විට ධර්මරාජ විද්‍යාලයේ 4 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර, සහෝදර ගණය යටතේ ඔහුගේ දෙවැනි දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කිරීමට යොමුකරන ලද අයදුම්පත අනුව බීආර් -55 යටතේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 54 ක් උපයාගෙන ඇත. එම සම්මුඛ පරීක්ෂණයේදී ‘සහෝදර පදනම’ මත අයදුම්පතෙහි අංක 5 අනුව ජයග්‍රහණ/දායකත්වය යටතේ ලකුණු ලබා දීමේ ක්‍රමවේද 2 කි. එනම්,

1. පාසලේ සිටින සහෝදරයන් පාසලට ලබාදී ඇති ජයග්‍රහණ සඳහා ලකුණු 06
2. දෙමාපිය/භාරකරු පාසලට දක්වන ලද විවිධාකාර සහයෝග සඳහා ලකුණු 04

මෙම වර්ගීකරණය අනුව ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් අංක 01 කරුණ යටතේ ලකුණු ලබා දී නොමැති අතර, දෙවන කරුණු යටතේ ලකුණු 4 ක් ලබා දෙමින් මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 54 ක් වී ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය අනුව අංක 5 යටතේ ජයග්‍රහණ/දායකත්වය යටතේ පළමුවන කරුණට අදාළව ලකුණු 06ක් ලබා දී ඇති අතර, දෙවන කරුණ යටතේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් ලබා දුන් ලකුණු 4 වෙනුවට එම ලකුණු ප්‍රමාණය ලකුණු 2 ක් දක්වා අඩු කර ඇති බව නිරීක්ෂණය වේ.

ලකුණු ලබාදීමේ පත්‍රිකාවේ තුන්වන කරුණ යටතේ 'පදිංචිය තහවුරු කරන ලේඛන වලට අනුව' ලියාපදිංචි බදු ඔප්පුව/රජයේ නිල නිවාස සඳහා ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 4 ක් ලබා දුන්නද එය ලකුණු 1 ක් දක්වා අඩු කර අභියාචනා මණ්ඩලයෙන් මුළු ලකුණු සංඛ්‍යාව ලකුණු 55 කට පරිවර්ථනය කර ඇති බවද නිරීක්ෂණය වේ.

තවද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දී ඇති තමන්ට වඩා අඩු සුදුසුකම් සහිත දරුවන් සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් විරෝධතා ඉදිරිපත් කර තිබුනද එම විරෝධතා සලකා බැලීමක් සිදුකර නොමැති අතර, අදාළ විරෝධතා ලේඛන කොමිෂන් සභාව විසින් සිදුකරන ලද පරීක්ෂණයට ඉදිරිපත් කරන ලෙසට වගඋත්තර පාර්ශවය වෙත දන්වා ඇතත්, එම ගොනු කොමිෂන් සභාවට ඉදිරිපත් කොට නොමැත. ඒ සම්බන්ධයෙන් වගඋත්තරකාර විදුහල්පතිවරයා සඳහන් කර ඇත්තේ අදාළ ගොනු ජනාධිපති විමර්ශන ඒකකය වෙත රැගෙන ගොස් ඇති බවයි. එබැවින් විරෝධතා ගොනුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේ හැකියාවක් ලැබී නොමැත.

මේ අතරතුර 2017.08.27 දිනෙන් යුතුව පැමිණිලි පාර්ශවය විසින් කොමිෂන් සභාවට ලිපියක් ඉදිරිපත් කරමින් තම පළමු දරුවා අධ්‍යාපනය ලබන ධර්මරාජ විද්‍යාලයටම දෙවැනි දරුවාද තෝරා නොගත් බැවින් ඔහු මානසික ගැටළුවකින් පෙළෙන බවත් එබැවින් ඒ සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහාද යොමුවී ඇති බවත් දන්වා ඇති අතර, ඊට අදාළ වෛද්‍ය වාර්තාද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මෙම තත්වය සම්බන්ධයෙන් සඳහන් කරමින් පැමිණිලි පාර්ශවය වෙත සහනයක් සලසා දීමේ හැකියාව සම්බන්ධයෙන් විමසා 2018.06.13 වන දින ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලිඛිත දැනුම්දීම් සිදුකර ඇතත්, ඊට කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැති බවද නිරීක්ෂණය වේ.

අනතුරුව පැමිණිලිකරු විසින් 2020.09.21 දිනැතිව නැවත කොමිෂන් සභාව වෙත ලිපියක් යොමු කරමින් 2017 පොරොත්තු ලේඛනයට පරිබාහිරව දරුවන් කිහිප දෙනකු ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කර ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකරන ලෙසට ඉල්ලා ඇත. ඒ සම්බන්ධයෙන් වගඋත්තර

පාර්ශවය වෙතින් කරුණු විමසා ඇති අතර, ඔහු විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද 2020.10.24 දිනැති ලිපියෙන් දක්වා ඇත්තේ, 2017 පොරොත්තු ලේඛනයට පරිභාහිරව ළමුන් දෙදෙනකු අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් අධ්‍යක්ෂකගේ නියෝග මත ඇතුළත් කර ඇති බවයි.

ඒ අනුව මේ පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කරමින් හා පැමිණිලි පාර්ශවයට ඉන් අගතියක් සිදුවී ඇති බැවින් මෙම දරුවාද ධර්මරාජ විද්‍යාලයේ 4 ශ්‍රේණියට ඇතුළත් කිරිමට සලකා බලන ලෙසට වගඋත්තර පාර්ශවය වෙත දන්වා ඇත. නමුත් කොමිෂන් සභාව (මහනුවර ප්‍රාදේශීය කාර්යාලය) විසින් සිදුකර ඇති මෙම දැනුම්දීමට මෙන්ම සිදුකරන ලද කැඳවීම් වලටද නිසි ප්‍රතිචාර නොදක්වමින් නොයෙකුත් හේතු දක්වමින් කොමිෂන් සභාව හමුවේ කරුණු දැක්වීම සහ පෙනී සිටීම ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පැහැරහැර ඇති බව නිරීක්ෂණය වේ.

මෙහිදී ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කිසිදු වගකීමකින් තොරව ලිපිවලට පිළිතුරු ලබානොදීම, පරීක්ෂණ සඳහා නොපැමිණීම මෙන්ම මෙම පැමිණිල්ලට අමතරව වෙනත් පැමිණිලි සඳහා ද වගකීමකින් තොරව කටයුතු කර ඇති බව නිරීක්ෂණය වී ඇති අතර, ඔවුන්ගේ අභිමතය අනුව කටයුතු කරමින් පැමිණිලි පාර්ශවය මෙන්ම කොමිෂන් සභාව ද අපහසුතාවයට පත්කර ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරුගේ දරුවාට ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් පදිංචිය සනාථ කිරීමේ ලේඛන යටතේ ලියාපදිංචි බදු ඔප්පුව සඳහා ලකුණු 4 ක් ලබා දී අභියාචනා මණ්ඩලයේදී එය ලකුණු 1 ක් දක්වා අඩුකිරීම සාධාරණ නොවන අතර, පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කරගැනීමේ චක්‍රලේඛනයේ ලකුණු 1 ක් ලබා දීමේ ක්‍රමවේදයක් නොමැත. අවම වශයෙන් ලකුණු 2 ක් ලබාදිය හැකි වන අතර, ඒ අනුව පැමිණිලිකරුගේ දරුවාට ලකුණු 3 ක් අඩුකිරීම සාධාරණ නොවන බව කොමිෂන් සභාවේ නිගමනයයි.

ජයග්‍රහණ සඳහා ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් ලකුණු ලබාදීමේ ක්‍රමවේදය නිවැරදි නොවන බව නිරීක්ෂණය වන අතර, පාසලේ ඉගෙනුම ලබන දරුවාගේ ජයග්‍රහණ සඳහා ලකුණු ලබාදී නොතිබූ නමුත් අභියාචනා මණ්ඩලය උපරිම ලකුණු 06 ක් ලබාදී ඇත. එනමුත් ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් දෙමාපිය/භාරකරු විසින් පාසලට දක්වන විවිධාකාර සහයෝග යටතේ ලකුණු 4 ක් ලබාදී තිබුනද අභියාචනා මණ්ඩලය විසින් එය ලකුණු 2 දක්වා අඩුකිරීම පදනමකින් තොරව සිදුකර ඇති බව නිරීක්ෂණය වේ. මෙම සියළු කරුණු අනුව පැමිණිලිකරුට පහත පරිදි ලකුණු ලැබිය යුතුව පැවැති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

| ඉදිරිපත් කරන ලද තොරතුරු | චක්‍රලේඛනය අනුව ලැබිය යුතු ලකුණු | ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් ලබා දී ඇති ලකුණු | අභියාචනා පරීක්ෂණයෙන් ලබා දී ඇති ලකුණු | මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණ අනුව ලැබිය යුතු ලකුණු |
|---|---|---|---|---|
| පාසලේ සිටින සහෝදරයින් | 30 | 11 | 11 | 11 |
| පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන | 04 | 04 | 01 | 04 |
| පදිංචි ස්ථානය (ආසන්නතාවය) | 35 | 35 | 35 | 35 |
| ජයග්‍රහණ 1. පාසලේ ඉගෙනුම ලබන දරුවාගේ | 06 | - | 06 | 06 |
| 2. දෙමාපිය/භාරකරු දෙන සහයෝගය | 04 | 04 | 02 | 04 |
| | 100 | 54 | 55 | 60 |

ඉහත අනුව, පැමිණිලිකරුගේ දරුවා හට ලකුණු 60 ක් ලබාදිය යුතුව තිබූ අතර, ධර්මරාජ විද්‍යාලයට සහෝදර පදනම යටතේ ළමුන් ඇතුළත් කරගැනීමේ අවම ලකුණු සීමාව ලකුණු 59 ක් වූ බැවින් මෙම පැමිණිලිකරුගේ දරුවා අදාළ ගණය යටතේ ඇතුළත් වියයුතු බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

එසේම පොරොත්තු ලේඛනයේ ළමුන් විශාල ප්‍රමාණයක් සිටියදී ඉන් බැහැරව අමාත්‍යංශ ලේකම්වරයාගේ නියෝග මත 2017 ළමුන් ඇතුළත් කිරීමේ ලේඛනයට ඇතුළත් නොවූ ළමුන් තිදෙනෙකු ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කිරීම තුළින් මෙම පැමිණිලිකරුගේ දරුවාට පමණක් නොව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට කැඳවන ලද සියළුම ළමුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සිදුවන බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

පැමිණිලිකරුගේ දරුවා 2017 වර්ෂයට අදාළ පොරොත්තු ලේඛනයේ සහෝදර පදනම යටතේ ස්ථානගතව සිටියදී 2017 ළමුන් ඇතුළත් කරගැනීම සඳහා අයදුම්පත් හෝ ඉල්ලුම්පත් ඉදිරිපත් නොකරන ලද ළමුන් ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කරගැනීම තුළින් වගඋත්තරකාර අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් විසින්ද, චක්‍රලේඛනයට අදාළව පැමිණිලිකරු හට හිමිවිය යුතු නිවැරදි ලකුණු ප්‍රමාණය ලබා නොදීමෙන් වගඋත්තරකාර විදුහල්පති ඇතුළු අභියාචනා මණ්ඩලයේ සභාපතිවරයාද පැමිණිලිකරුට අගතියක් සිදුකරමින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් 'නීතිය පසිඳලීම, ක්‍රියාත්මක කිරීම, සර්ව සාධාරණ විය යුත්තේය' යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බව මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී හෙළිදරව් වී ඇත. එබැවින් පැමිණිලිකරුගේ දරුවා වන කළණ සුධම් වීරතුංග සිසුවා මහ/ධර්මරාජ විද්‍යාලයේ නියමිත ශ්‍රේණියට ඇතුළත් කිරීම උචිත බැවින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට අධ්‍යක්ෂ (ජාතික පාසැල්) වෙත මෙහි පිටපතක් යොමු කරනු ලැබේ.

2022.10.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අධ්‍යක්ෂ (ජාතික පාසැල්),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. — ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීමට

02. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය, මහනුවර.

B/h